*සැ. යු.-* 2012.03.09 දින පළ වූ අංක 1,749 දරන *ගැසට් පත්‍රයේ* I - III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,750 - 2012 මාර්තු මස 16 වැනි සිකුරාදා - 2012.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 58 |

*සැ. යු.* - (i) පණ්ඩු බණ්ඩාරනායක හෙළ ජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම් 2012 මාර්තු මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/34474.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකයඃ
පළාත්/ඉකො/ඉ/6/මනකු/දීම/2-1.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම දිස්ත්‍රික්කයේ මනකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 612 ඒ ආවිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ආවිගම ගමේ බී. එම්. සිරිසේන ජනපද නිලධාරී විසින් අඳින ලද දළ අනුරේඛනයේ අතිරේක අංක 01, 02, 03 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 04 රූඩ් 03 පර්චස් 32 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ළමා නිවාස කටයුතු සඳහා ලංකා බෞද්ධ ළමා නිවාසය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | බී. කේ. පෙරේරාගේ ඉඩම හා ප්‍රධාන මාර්ග රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන මාර්ග රක්ෂිතය හා අතුරුපාර රක්ෂිතය ; |
| *දකුණට* | : | කේ. ඩී. සුමනාවතීගේ ඉඩම සහ අතුරු පාර රක්ෂිතය ; |
| *බටහිරට* | : | බී. කුලතුංග පෙරේරාගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2012.02.06 දින සිට) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කල වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ළමා නිවාස කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඊ)* අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඌ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ප්‍රසාදී උබයසිරි,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 පෙබරවාරි මස 10 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6, හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-693

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/33940
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- ඉකො/12/ගා/බල/දී.බ.

## අංක21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 16ඒ, පැලැගස්පලාත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පැලැගස්පලාත ගමේ අංක ජීඒ/බීඑල්පී/09/125 පිඹුරේ කැබලි අංක බී වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0740 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් ආරණ්‍ය සේනාසනයක් පවත්වාගෙන යාම සඳහා සිරි විවේකාරාම සේනාසනයේ භාරකාර මණ්ඩලයවන අහුංගල්ලේ ප්‍රියධර්මා සිල් මාතාව, හබරාදූව ලියනගේ අනූෂා ගයානි මිය, ජී. ජී. ඉන්ද්‍රානි මිය, යමුනා ප්‍රියදර්ශනී මිය, කුමාරි රත්නායක මිය සහ සිරියාවතී ලියනගේ මිය යන අය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

*කැබලි අංක : බී*

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි.ගා. 366 හි කැබලි අංක 29, 30 සහ කැබැලි අංක ඒ ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක ඒ සහ මු. පි. ගා. 366 හි කැබලි අංක 30; |
| *දකුණට* | : | මු. පි. ගා. 366 හි කැබලි අංක 30; |
| *බටහිරට* | : | මු. පි.ගා. 366 හි කැබලි අංක 30 සහ 29. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* :- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කරන ලද 2012.01.30 දින සිට වසර 30ක් ඉදිරියට);

*(ආ)* *වාර්ෂික බදු මුදල* :- 2012 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි;

(ඈ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩමෙහි ආරණ්‍ය සේනාසනයක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම ඉහත (ඈ) හි සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඉ) යෝජිත ගොඩනැගිලි තැනීම සඳහා අරමුදල් එකතු කිරීමේ, පරිපාලනය කිරීමේ අයිතිය බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමා සතුවේ.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

(ඌ) ප්‍රාදේශීය ලේකම්ගේ ලිඛිත අවසරයක් නොලබා අදාළ ඉඩමේ පිහිටි ගස්කොළන් විනාශ කිරීම හෝ කපා හෙළීම නොකළ යුතුය.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 පෙබරවාරි මස 23 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-715

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/26006.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- එන්සීපී/පීඑල්සී/6/10/4.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක 243 ඕ පුම්බුකර් නිලධාරි කොට්ඨාශයේ පාලයුත්තු ගමේ අංක එෆ්වීජී 15 පිඹුරේ/අනුරේඛණයේ කැබලි අංක 2330 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0258 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා සුබ්‍රමනියම් සුන්දරමූර්ති මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 2334 සහ කැබලි අංක 2329; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 2329 සහ කැබලි අංක 2223; |
| *දකුණට* | : | කැබලි අංක 2223 කැබලි අංක 2337; |
| *බටහිරට* | : | කැබලි අංක 2337 සහ කැබලි අංක 2336 සහ කැබලි අංක 2331. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* :- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කරන ලද 2011.09.16 දින සිට);

*වාර්ෂික බදු මුදල* :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කල 2011 වර්ෂයේ දියුණු වටිනාකමින් 4% කි ;

*වාර මුදල* :- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) ගරු ඇමතිතුමා අනුමත කරන ලද දින සිට අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 පෙබරවාරි මස 23 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-717

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/26010.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :ඊපී/28/එල්ඊඑස්/ටීආර්අයි/ ටීජී/196.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අභයපුර, 244එන් ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ලව්ලේන් ගමේ අංක එෆ්වීපී29පිඹුරේ/අනුරේඛනයේ කැබලි අංක 1721 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0655 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා කනක්ක හේවගේ සුමනශීලි මහත්මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 1722; |
| *නැගෙනහිරට* | : | කැබලි 1772,1301 (පාර) 310 (පාර) 311 (පාර) - එෆ්වීපී 28; |
| *දකුණට* | : | කැබලි අංක 1301 (පාර) 310(පාර) 311 (පාර) හා 1772 (පාර) ; |
| *බටහිරට* | : | කැබලි අංක 1722. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට අදහස් කොට තිබේ.

*(අ)* බදු කාලය :- අවුරුදු තිහයි (30) 1995.06.15 සිට ඉදිරියට ;

*වාර්ෂික බදු මුදල* :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ 1995 වර්ෂයේ නොදියුණු වටිනාකමින් 4%කි;

*දඩ මුදල* :- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ;

*(උ)* අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

(ඒ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවාසේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළතදී අදාල ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කුෂානි බොරලැස්ස,
සහකාර ඉඩම් කොමසාරිස්,
*ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.*

2012 පෙබරවාරි මස 23 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-716

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.